# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2207/10 - 2020 දෙසැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2020.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ඌව පළාත් සභාව**

ඌව පළාතේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සංචාරක කලාපයක් නම් කිරීම

ඌව පළාතේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සංචාරක කලාපයක් නම් කිරීමට අදාළ දැන්වීම් කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළකරමි.

02. මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවී දින 30 ක් ඉක්ම ගිය පසු මෙම කෙටුම්පත අනුමත කරනු ලබන බව දන්වා සිටිනු ලැබේ. මෙම කෙටුම්පතෙහි අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 30 ක් තුළ දී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතු ය.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ගරු ආණ්ඩුකාරවර,
ඌව පළාත.

2020 ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින,
බදුල්ල,
ඌව පළාත් සභාව,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඌව පළාතේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සංචාරක කලාපයක් නම් කිරීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා විසින් පහත සඳහන් ප්‍රදේශ ඇල්ල සංචාරක කලාපය වශයෙන් නම් කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

එනම්, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් —

1. 68 බී ඇල්ල;
2. 69 ජී හෙට්ටිපොළ;
3. 68 එෆ් ඉඩමේගම;
4. 69 ඊ කිතල්ඇල්ල;
5. 68 සී මදුරගම;
6. 68 ජේ නිව්බර්ග්;
7. 69 එෆ් රාවණා ඇල්ල;
8. 68 ඊ යහලේවෙල,

යන ග්‍රාම නිලධාරි වසම් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම අරභයා ඇල්ල සංචාරක කලාපය ලෙස නම් කරමි:—

**අරමුණු**

1. ඇල්ල සංචාරක කලාපය තුළ සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය.
2. ඇල්ල සංචාරක කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින් ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිගත සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම.
3. සංචාරක කර්මාන්තයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කර ගනිමින් සංචාරක සත්කාරක සේවා සපයන්නන් නියාමනය හා සමීප අධීක්ෂණය.
4. ඇල්ල සංචාරක කලාපය වෙත පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක තෘප්තිය ඉහළ නැංවීම.
5. සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන්ට හදිසි ආපදා / වසංගත තත්ත්වයක දී සහන සැලසීම සඳහා මැදිහත් වීම.
6. සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සමඟ ඇති වී ඇති පාරිසරික සහ සමාජීය ගැටලු සඳහා පිළියම් යෙදීම.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.